LIBRARY OF PARLIAMENT
1979-3-23
COLOMBO.

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1979 අංක 14 දරන මුදල් නීති (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1979 මාර්තු මස 7 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1979 මාර්තු මස 09 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 25 යි    තැපැල් ගාස්තුව : ශත 25 යි

1979 අංක 14 දරන මුදල් නීති (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1979 මාර්තු මස 7 වන දින]

එල්. ඩී.—ඕ. 4/79

මුදල් නීති පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1979 අංක 14 දරන මුදල් නීති (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන මුදල් නීති පනතේ 58 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ඒ පනතේ 58අ වන වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :— 422 වන අධිකාරයෙහි 58අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"නීතියෙන් වලංගු ලෙස හැර අන්‍යාකාරයකට මුදල් කාසි පාවිච්චි කිරීම.

58අ. (1) ශ්‍රී ලංකාවෙහි වලංගුව පවතින යම් කාසියක්, මුදල් මණ්ඩලයේ අනුමතය නොමැතිව උණු කරන, කඩා වෙන් කරන, සිදුරු කරන, විරූප කරන නැතහොත් නීතියෙන් වලංගු ලෙස හැර අන්‍යාකාරයකට පාවිච්චි කරන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය කඩ කරමින් කටයුතු කරනු ලැබ ඇත්තේ යම් කාසියක් සම්බන්ධයෙන් ද එම කාසියෙන් ලබාගත් බවට තමන් දන්නා වූ නැතහොත් එසේ ලබාගත් බවට විශ්වාස කිරීමට තමන්ට සාධාරණ හේතු තිබෙන්නා වූ යම් ලෝහයක් හෝ භාණ්ඩයක් දැනුවත්ව පාවිච්චි කරන, සන්තකයෙහි තබාගෙන සිටින නැතහොත් ඒ සම්බන්ධයෙන් කටයුතු කරන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 122 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 122 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(2අ) 58අ වගන්තියේ (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය කඩ කිරීමේ හේතුවෙන් වරදකට වරදකරු වන සෑම තැනැත්තකු ම, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රුපියල් තුන් දහසක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාර

යෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය. 58අ වගන්තියේ (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය හෝ යටතේ වූ වරදක් සඳහා යම් තැනැත්තකු මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට, වරද කරනු ලැබුවේ යම් කාසියක් සම්බන්ධයෙන් ද ඒ කාසිය හෝ ඒ කාසියෙන් ලබාගත් යම් ලෝහයක් නැතහොත් වෙනත් භාණ්ඩය හෝ රාජ්‍ය සන්තක විය යුතු බවට මහෙස්ත්‍රාත්වරයා විසින් ආඥාවක් කරනු ලැබිය හැකි ය.''; තවද

(ආ) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(3) (2) වන උපවගන්තිය හෝ (2අ) උප වගන්තිය මඟින් කිසිම දඬුවමක් නියම නොකරන ලද වරදකට වරදකරු වන සෑම තැනැත්තකු ම මහෙස්ත්‍රාත් වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයක් නොඉක්මවන දඩය කට හෝ එක් මාසයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම කට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.".